**නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය (ග්‍රාමීය ජල සංරචකය) - 2014**

------------------------------------------------------------------------------------------

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ (ග්‍රාමීය ජල සංරචකය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල් - පී 98 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.08 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදිකිරීම හා ව්‍යාප්ත කිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ එමඟින් ප්‍රදේශයේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා දිළිඳුකම දුරලීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 6,054 වන අතර ඉන් ජපන් යෙන් මිලියන 4,904 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. තවද ජපන් යෙන් මිලියන 924 ක් ව්‍යාපෘතියේ ග්‍රාමීය ජල සංරචකය සඳහා වෙන්කර තිබුණු අතර ඒ සඳහා ජපන් යෙන් මිලියන 764 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. 2010 මාර්තු 26 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2013 දෙසැම්බර් වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 ජූලි 31 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි

ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

ව්‍යාපෘතියේ ජාතික සංරචකයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.මිලියන 4.25 ක් වූ බැඳීම් ගාස්තු හා රු.මිලියන 10.89 ක්වූ පොලී ගාස්තු ග්‍රාමීය ජල සංරචකයට අයකර තිබුණි.

2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ණය ගිවිසුමේ 2 උපලේඛනයේ 1 වගන්තියට අනුව දේශීය බදු හා ගාස්තු සඳහා මූල්‍යයනය කිරීමට හිමිකම් නොමැති වුවද රු.මිලියන 4.21 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් ගාස්තු ණය මුදල් වලින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

2.2.3 වියදම් පරිපාටි ප්‍රකාශනයට අදාළ කරුණු

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රතිපූර්ණ කාර්යයන් සඳහා එකතුව රු.මිලියන 250.75 ක්වූ ඇස්තමේන්තුගත මුදලක් මත වියදම් ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ බවත් ඉන් රු.මිලියන 183.35 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ණය සපයන නියෝජිතායතනය විසින් ප්‍රතිපූර්ණය කර තිබූ බවත් නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | **2014** දෙසැම්බර් **31** දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 764.00 | 972.01 | 316.60 | 282.85 | 231.65 | 1,180.57 |
| ශ්‍රී ලං ර | 160.00 | 203.56 | 110.92 | 100.77 | - | 230.72 |
| එකතුව | 924.00 | 1,175.57 | 427.52 | 383.62 | 231.65 | 1,411.29 |

3.2 භෞතික ප්‍රගතිය

---------------------

ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ත්‍රිකුණාමලය, අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කවල සිවිල් ඉදිකිරීම් වැඩ හා නළ එළීමේ කාර්යයන් 24 ක් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව 2014 ජුලි 31 දිනට එම කාර්යයන් පිළිබඳ සියයට 99 ක වැඩ භෞතිකව සම්පූර්ණ කර තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 152.93 ක පිරිවැයකට පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ සිවිල් වැඩ හා නළ සැපයීම හා එළීම සඳහා 2012 වර්ෂයේදී ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්තුව නිමකර 2015 පෙබරවාරි 02 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී තිබුණි. තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 මැයි 28 දින විගණකවරුන් විසින් කරන ලද භෞතික පරීක්ෂණයේදී ජල ටැංකියේ පාදක තට්ටුවේ (base slab) ස්ථාන 6 ක ජලය කාන්දුවීම් පෙන්වා දී තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු විසින් උප කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් එම දෝෂ නිවැරදි කර තිබුණි. උප කොන්ත්‍රාත්කරු විසින් වර්ෂ 10 ක කාල පරිච්ඡේදයකට වගකීම් සහතිකයක් ඉදිරිපත් කර තිබුණද මුල් වගකීම් සහතික ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් 2015 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟත්වය ලබා ගැනීමෙන් තොරව පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ පුල්මොඩෙයි - කෝකිලායි මාර්ගය ඔස්සේ U - PVC බෙදාහැරීම් නළ එළිම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.914,375 ක පිරිවැයකට මීටර් 1,100 ක් දිගට එළන ලද U - PVC නළ, මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් එම නළ එළන ලද දින සිට මාස 01 ක් ඇතුළත සම්පූර්ණයෙන්ම හානි වී තිබුණි.

(iii) ඊට අමතරව, ජලය පිරිසිදු කිරීම් පද්ධතියට ජලය පොම්ප කිරීමේ කාර්යය සඳහා පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘතිය විසින් ඉදිකරන ලද ජලය ලබා ගන්නා ළිං දෙකකින්, යාන් ඔය අසළ ඉදිකරන ලද ජලය ලබා ගන්නා එක් ළිදක් විදුලිය සැපයීම නොමැති වීම හේතුවෙන් 2015 ජුනි 24 වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ජල සම්පාදන යෝජනා ක්‍රමයක් පදවිශ්‍රීපුර ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පදවිශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන ජනතාව ප්‍රබල ලෙස නිදන්ගත වකුගඩු රෝගවලින් පෙළෙන බව හඳුනා ගෙන තිබුණද, ජලය පිරිසිදු කිරීමේ කාර්යය සඳහා ජල පිරිසිදු කිරීම් පහසුකම සැපයීමට ව්‍යාපෘතිය

විසින් පියවර ගෙන නොතිබුණි. හැරූ ළිඳෙන් සෘජුවම පිරිසිදු නොකළ ජලය ගෘහ ඒකක වලට බෙදා හරින බව භෞතික ස්ථානීය පරීක්ෂණයන්හිදී නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය විසින් මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 149.45 ක් වැය කර තිබුණද, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පානීය ජලය මිලදී ගැනීම සඳහා ප්‍රදේශයේ ප්‍රතිලාභීන්ට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ii) ප්‍රජා සහභාගීත්වය සහිතව ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද පදවිශ්‍රීපුර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ප්‍රධාන බෙදාහැරීම් මාර්ගයේ නළ එළිමේ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 1.10 ක මුදලක් ඉල්ලීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මඩකලපුව දිස්ත්‍රික්කයේ කරදියනාරු හි ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා ගන්නා නොගැඹුරු ළිං දෙකක්, ජල කුළුණු හා පොම්පාගාර ආදිය ඉදිකිරීම සඳහා රු.මිලියන 20.91 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් ව්‍යාපෘතිය විසින් පිරිනමා තිබුණි. ඉදිකිරීම් වැඩ කරගෙන යන අතර එක් නොගැඹුරු ළිඳක් කඩා වැටී තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘතිය විසින් කඩා වැටුණු නොගැඹුරු ළිඳ සඳහා නළ ළිඳක් සවිකිරීමට රු.මිලියන 1.99 ක පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. නළ ළිඳෙහි පොම්පය සවිකිරීම සඳහා පිළියෙල කරන ලද සැලැස්ම අනුව, පාෂාණ සිදුරේ විෂ්කම්භය මිමී 178 ක් විය යුතුය. කෙසේ වුවද පොම්පය සවිකිරීමට පෙර පාෂාණ සිදුරේ විෂ්කම්භය මිමී 150 ට අඩු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම කාර්යය සඳහා මිලදී ගත් පොම්පය සවි කිරීමට නොහැකි විය. තවද කැණීම් සිදුර (bore hole) මීටර් 12 ක් ගැඹුර දක්වා මිමී 225 ක් විය යුතුය. කෙසේ වුවද ඉදි කරන ලද කැණීම් සිදුරේ විෂ්කම්භය මිමී 178 ක් වී තිබුණි. නළ ළිඳ සවිකිරීමේ වැඩ 2014 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබුණද රු.99,755 ක්වූ රඳවා ගැනීම් මුදල් එදිනට කොන්ත්‍රාත්කරුට මුදා හැර තිබුණි.

(ඈ) මඩකලපුව දිස්ත්‍රික්කයේ කරදියනාරු හා අලන්කුලම් ජල සම්පාදන යෝජනා ක්‍රම පිළිබඳ 2015 ජුනි 04 දින සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී එම ජල සම්පාදන යෝජනා ක්‍රම පිළිබඳ ජලය පිරිසිදු කිරීම් ක්‍රමය තාක්ෂණික නිලධාරීන් විසින් නියාමනය කර නොතිබූ බව අනාවරණය විය. තවද මහජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීම පිළිබඳව තහවුරු කර ගැනීමට තත්ත්ව පරීක්ෂණ සිදු කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය විසින් භාරදෙන ලද ජල සම්පාදන යෝජනා ක්‍රම වල වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ප්‍රජා මධ්‍යස්ථාන විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි.